සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

15528

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය - I

කාලය / நேரம் / Time: පැය 1 යි

නම / பெயர் / Name ..............................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 3 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(01) වැඩිහිටියන්ට ඉහ නිකට බලා කතා කළ යුතුය.
1. ආශිර්වාදාත්මක ලෙස 2. කාරුණික ලෙස 3. මිත්‍රශීලී ලෙස 4. ගෞරවාන්විත ලෙස

(02) සරුවට වැවී තිබුණු කුඹුරු යාය ගංවතුරට විනාශ වී යෑමෙන් විශාල මුදලක් වතුරේ ගිය බවට ගොවිහු මැසිවිලි නගති.
1. සේදී ගිය 2. අපතේ ගිය 3. ගංවතුරට හසුවූ 4. යටවී ගිය

(03) ඉවක් බවක් නැතිව වන සම්පත විනාශ කරන්නෝ මිනිසුන්ගේ මෙන්ම සතුන්ගේ ද ජීවන පැවැත්ම අනතුරට හෙළති.
1. නිරන්තරයෙන් 2. අවිචාරශීලීව 3. අනවසරයෙන් 4. අනපේක්ෂිතව

- 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) විශේෂ අධ්‍යාපන ඒකකයේ දරුවකු විසින් ඉදිරිපත් කරන ලද .............................. රංගනය කාගේත් සිත් ගත්තේය.
1. අභිවන්දන 2. අභිනන්දන 3. අභිරූපණ 4. අභිප්‍රේරණ

(05) පරිසරයට .............................. වීමේ හැකියාව නිසා සතුරන්ගේ ගොදුරු බවට පත්වීමෙන් වැළකීමට ඇතැම් සත්තු සමත් වෙති.
1. අනුවර්තනය 2. සම්මිශ්‍රණය 3. පරාවර්තනය 4. පරිවර්තනය

(06) .............................. අනුව ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය ශීඝ්‍රයෙන් වැඩිවන බව පෙනී යයි.
1. අධීක්ෂණවලට 2. සමීක්ෂණවලට 3. ගවේෂණවලට 4. පරීක්ෂණවලට

(07) සෑම පදයකම අක්ෂර වින්‍යාස නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ස්ථූල, දේවස්ථානය, විස්කම්භය, උත්කෘෂ්ට
2. සංයමය, දුෂ්චරිත, යුද හමුදාව, වීර්යය
3. විද්‍යාමාන, අභ්‍යවකාශය, ලාංකීය, ව්‍යූහය
4. සංගණනය, කෙළිබිම, බණිජ, න්‍යෂ්ටික

(08) ච, ඡ. ජ, ඣ, ඤ යන අකුරු ඇතුළත් අක්ෂර වර්ගය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. න වර්ගය 2. ක වර්ගය 3. ච වර්ගය 4. ප වර්ගය

(09) අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.
1. ලග්ගල, මතුගම, අලව්ව, යාපනය
2. මාතලේ, මිනුවන්ගොඩ, බියගම, රුවන්වැල්ල
3. පස්සර, මහරගම, රත්නපුරය, වාරියපොළ
4. පුත්තලම, වේයන්ගොඩ, ඉංගිරිය, බදුල්ල

(10) එක් එක් වචනයෙහි මුල් අකුරෙහි ඉස්පිල්ල, ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය පිළිවෙළින් යෙදුණු වචන සහිත පද පේළිය තෝරන්න.
1. දැහැමි, ප්‍රහාර, තීරය, සාදය
2. පියන, සාමය, දූ වරුන්, පැතුම
3. විනීත, සභාව, සුදන, කැවිලි
4. තියුණු, කෑදර, භූ සුර, බෙරය



CamScanner

(11) ප්‍රාණවාචී බහුවචන උක්ත පද පමණක් යෙදුණු වරණය තෝරන්න.
1. නිවැසියන්, ගුරුවරු, නැට්ටුවෝ, වහලුන්
2. මිනිසා, ස්ත්‍රීහු, සංචාරකයෙක්, ග්‍රන්ථ
3. ගැමියෝ, විද්වත්හු, නරඹන්නෝ, සෙබළු
4. උත්සාහවන්තයෝ, මන්ත්‍රීවරුන්, දූදනන්, ලේකම්වරු

(12) දී ඇති පද අතුරෙන් ළඟ සම්බන්ධයක් නොදැක්වෙන පදයක් ද ඇතුළත් වරණය තෝරන්න.
1. නිල්, කහ, රතු, රෝස
2. සතුට, ප්‍රීතිය, සංවේගය, සොම්නස
3. අහස, තරු, සඳ, වලාකුළු
4. කෙසෙල්, ජම්බු, දොඩම්, අන්නාසි

(13) එක් එක් පේළියේ මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් අතුළත් වරණය තෝරන්න.
1. මව - මාතා, ජනනී. ගැහැනි, දිනිති
2. ස්ථිර - නියත, ඒකාන්ත, නිසැක, නිශ්චිත
3. උසස් - උත්තම, උතුම්, උත්කෘෂ්ට, උදාර
4. බබළන - දිමුත්, ප්‍රභාවත්, පබසර, උදුල

(14) යුගල පදයක් නොයෙදුනු පද පේළිය තෝරන්න.
1. ලේසි පාසු, වංහුං, නහින දෙහින, සද්ද බද්ද
2. විහිළු තහළු, අබල දුබල, ඕපදූප, තරහමරහ
3. තෑගි බෝග, සමගි සම්පන්න, අගහිඟ, උදව් පදව්
4. කුදු මහත්, ඇඟපත, ගණන් හිලව්, තුටු පහටු

(15) මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.
1. අපි සෙමින් කඳු මුදුනට ම ළඟා වූයෙමු.
2. බාලිකාවෝ ගී කියමින් නර්තනයෙහි යෙදුනාහ.
3. සැදැහැවත්හු මල් පුදනු වස් විහාරයට යති
4. ගම්වැසියෝ සමගි දමින් වෙළී දිවි ගෙවති.

(16) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන පළාත් නාමය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. දඋමැරුහු 2. නගෙහිනැරු 3. රවසමුබග 4. හිබදාස්ර

(17) A පුංචි අපට දැන් තේරෙයි - සෝමලතා සුභසිංහ
B මනමේ - කේ. බී. හේරත්
C සුභ සහ යස - සයිමන් නවගත්තේගම
D තලමල පිපිලා - සුගතපාල ද සිල්වා

A, B, C, D යුගල අතුරෙන් නිවැරදි යුගලය වන්නේ,

1. A හා D ය 2. B හා C ය 3. A හා C ය 4. B හා D ය

(18) "මොකද දික්කසාද වෙන්න හේතුව" හුණුවටයේ නාටකයෙන් උපුටාගත් ඉහත කොටස ප්‍රකාශ කරන්නේ,
1. ග්‍රෑෂා 2. නටාලියා 3. නීතිඥයා 4. අසඩක්

- **අංක 19 සිට 20 යටතේ ඇති එක් එක් ප්‍රකාශයේ අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

(19) අනතුරුදායක වැඩක් දුර්වලයකු ලවා කරවා ගැනීම,
1. බළලුන් ලවා කොස්ඇට බාවන්නා වගෙයි
2. බල්ලන්ට ලෙලිපොල් දුන්නා වගෙයි
3. දඹුලු ගිහින් තලගොයින් මරාගෙන ආවා වගේ
4. නරින්ට කුකුළු කොටුව බාර දුන්නා වගෙයි

(20) එක කරුණකින් කටයුතු රාශියක් ඉටුකර ගැනීම,
1. එක ගලෙන් කුරුල්ලෝ දෙන්නයි
2. කතාව දෝලාවෙන් ගමන පයින්
3. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගෙයි
4. ගමරාළගේ වංගෙඩිය වගෙයි

(21) මුලින් දී ඇති එක් එක් පදයේ නිවැරදි විසන්ධිය දැක්වෙන වරණය තෝරන්න.
1. ගුරුතුමා = ගුරු + උතුමා
2. දැවුරුදු = දැ + අවුරුදු
3. දිවැස් = දිව් + ඇස්
4. පොල්ලත්ත = පොල් + වත්ත



CamScanner

(22) සන්ධි නොවූ පදයක් ඇති පේළිය තෝරන්න.
1. දැවුරුද්ද, නිරවුල්, දකුණත, දූප්පත්
2. යනෙන, ගුණාගුණ, ජීවනාධාර, පිනැති
3. ධර්මෝදය, විද්‍යායතනය, පොත්පත්, ලිග්ගල
4. ඔවුනොවුන්, පංචේන්ද්‍රිය, මහින්දාගමනය, මැදැගිල්ල

(23) මුලින් දී ඇත්තේ බහු අර්ථවත් පදයකි. ඒ පදයේ අර්ථයක් ඇතුළත් නොවන පදයක් ඇති පේළිය තෝරන්න.
1. සත් - සත්වයා, ශාස්ත්‍රය, ඡත්‍රය, ආයුධය
2. නා - නාගයා, නොපැමිණි, ඇතා, ස්නානය කොට
3. වණ - වර්ණය, තුවාලය, අක්ෂරය, වනාන්තරය
4. පිය - පාදය, පියා, පියාපත්, කැමති

(24) දී ඇති වචනවල තේරුම අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

ආකස්මික ව, සබවස නරමුල්, තුන් යලක්

1. හේතුවක් නැතිව, සත්‍යවචන, පැසුණු කෙස්, තුන්වරක්
2. ගස්මුල්, සත්විටක්, අසත්‍ය වචන, අදහස් නැතිව
3. තුන්වරක්, පැසුණු කෙස්, හේතුවක් නැතිව, සත්‍ය වචන
4. අදහන්නැතිව, ගස්මුල්, අසත්‍ය වචන, සත්විටක්

(25) "සතුනට" යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කළ විට නිවැරදිව දැක්වෙන පදය තෝරන්න.
1. සතු + නට 2. සත් + නට 3. සත් + උනට 4. සතුන් + අට

- **26 සිට 29 දක්වා දී ඇති වාක්‍යවල හිස්තැනට ව්‍යාකරණානුකූලව වඩාත් ගැලපෙන පදය තෝරන්න.**

(26) මා විභාගය සඳහා හොඳින් සූදානම් .............................. යාළුවෝ සිතති.
1. වෙමු'යි 2. වේවි'යැයි 3. වෙති'යි 4. වෙමි'යි

(27) නව අධ්‍යයන වර්ෂය සඳහා .......................... බඳවා ගැනීම ප්‍රමාද වෙයි.
1. සිසුවියෝ 2. ශිෂ්‍යයෝ 3. සිසුහු 4. සිසුන්

(28) නාට්‍ය සංදර්ශනය අවසානයේ .......................... තම නිවෙස් බලා පා නැගුහ
1. ළමයි සියල්ලන්ම 2. ළමයින් සියල්ලෝම
3. ළමයින් සියල්ලන්ම 4. ළමයි සියල්ලෝම

(29) ළමයින් මත් උවදුරෙන් බේරාගැනීමට .......................... මෙන්ම ගුරුවරුද උනන්දු විය යුත්තාහ.
1. දෙමව්පියෝ 2. දෙමව්පියෙක් 3. දෙමව්පියන් 4. දෙමව්පියකු

(30) මොනරාගල උපභාෂාවෙහි කොකිස් සඳහා යෙදෙන ව්‍යවහාරයක් වන්නේ,
1. අඹ 2. කිරිඅල 3. පුහුල් 4. ගස්ලබු

(31) අතීත කාල ප්‍රථම පුරුෂ කර්මකාරක ඒකවචන ක්‍රියා පදයක් වන්නේ,
1. පැවැත්විණි 2. පැවැත්වූයේය 3. පැවැත්වීය 4. පැවැත්වෙයි

(32) කථන ව්‍යවහාරයෙන් පවතින පහත සඳහන් වාක්‍යය ලිඛිත වාක්‍යයකට හැරවූ විට පිළිතුර වන්නේ කුමක් ද?

"මේ අය පරදියි කියල මම හිතන්නේ නෑ"

1. මොවුහු පරදිති'යි මම නොසිතමි 2. මොවුන් පරදිති'යි මම නොසිතමි
3. මොවුන් පරදීවියැ'යි මම නොසිතමි 4. මොවුහු පරදී යැ'යි මම නොසිතමි

(33) අනුරූප වචන සංයෝගවීමෙන් සෑදුණු වචන යුගල පමණක් සහිත වරණය තෝරන්න.
1. වර්ෂා කාලය, විදෙස් ප්‍රවෘත්ති, අඩ හෝරාව, කර්ම විභක්තිය
2. සිසු සැරිය, අත් යන්ත්‍ර, විස්තර ප්‍රචාරය, අහස් යාත්‍රා
3. මිතුදම්, නාවික යාත්‍රා, නර්තන පාඨමාලා, ඇසළ පෙරහැර
4. සත්ව හිංසා, දෘශ්‍ය කාව්‍ය, තුරුණු ශක්ති, ජාතික ගීය



CamScanner

(34) පහත සඳහන් කවියේ හතරවන පදය දී ඇති වරණ අතුරින් තෝරන්න.

පෙරකල් ජාතිය පැතුවා                    වැන්නේ
පරමල් පිදුවාදෝ පල                    දුන්නේ
නරමුල් ඇඟ ඇට කිඹුලකු                    වැන්නේ
.......................................................................

1. මහල්ල නුඹගේ හිමිද                    අසන්නේ
2. ලීල් නැතිව නිසරුව                    නෙපලන්නේ
3. හැමකල් මළ දා දෝ සැප                    වන්නේ
4. වාල් විඳින දුක මෙනුඹ                    විඳින්නේ

● 35 සිට 37 තෙක් ප්‍රශ්නවලට දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

35. 1. සමාජ සේවකයෝ වන අප අසරණයන්ට පිහිට වෙමු.
2. සඳ රැසින් බබලන පර්වත සමූහය අපේ සිත් ගනිති.
3. අපි මේ සත්‍ය වටහා ගන්නේ කෙදිනක ද?
4. ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයෙකු වූ පරණවිතානයෝ මෙරටට මහත් කීර්තියක් ගෙනදුන්හ.

36. 1. සිසුහු උනන්දුවෙන් ඉගෙන ගන්නා බව පෙනේ.
2. වැඩිහිටියෝ දරුවන්ට ආදර්ශවත් විය යුතුය.
3. අප පාරේ දකුණු පසින් ගමන් කරමු.
4. ගීත රචකයෙකු වූ කරුණාරත්න අබේසේකර මහතා එකල සිටි දක්ෂ නිවේදකයෙකි.

37. 1. මිනිස්සු දුරාචාරවල යෙදෙන්නේ ඇයි.
2. තම දියණියක් වෛද්‍යවරියක බව ඇගේ මව පැවසුවා ය.
3. බැතිමත්හු දෙවියන් පුදයි.
4. තාත්තා ද, අම්මා ද, මම ද උත්සවයට සහභාගි වූහ.

38. රැක් අත්තන පෙතන් පලු බෝ මී                    කහට
බක් මී දිවුල් කොළ බෝ දාඹු මී                    බට
හික් දඹ ලෝලු කොබ්බෑ කුරටි                    දෙමට
අත්වල අත අල්ලනු මරු මුවා                    කොට

ඉහත කවියෙන් කියවෙන්නේ,

1. වනාන්තරයක් පිළිබඳ
2. ඖෂධ පැලෑටි පිළිබඳ
3. නැකැත් පිළිබඳ
4. පළමුව කැපිය යුතු ස්වාභාවික ගස් පිළිබඳ

● 39 - 40 දක්වා දී ඇති පාඨවලට වඩාත් සමීප වරණය තෝරන්න.

39. දැනට වර්ධනය වෙමින් පවත්නා මන්දපෝෂණය මැඩලීමට රජය උත්සුකවීම කාගේත් සතුට ට කරුණකි.
1. පැතිරෙන මන්දපෝෂණය වැළැක්වීමට රජය ක්‍රියා කිරීම ප්‍රශංසනීයයි.
2. වසර කීපයක සිට රටපුරා මන්දපෝෂණය පැතිරේ.
3. රටපුරා ක්‍රමයෙන් ව්‍යාප්ත වන මන්දපෝෂණය මැඩලීමට ක්‍රියාකළ යුතුයි.
4. මන්දපෝෂණය ගැන රජයේ දැඩි අවධානය යොමුවීම සතුට ට කරුණකි.

40. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් කෙරෙන්නේ ස්වභාවධර්මය හා මිනිසා අතර ඇති උත්තරීතර බැඳීමට හානියක් නොකර ජීවිත ගමන යෑමට රුකුලක් වීමය.
1. සොබාදහමට සමීප වූ ආයුර්වේදය ජීවන ගමනට විශාල රුකුලක් සපයයි.
2. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ස්වභාව ධර්මයට සමීපව ජීවිතයට රුකුලක් සපයයි.
3. මිනිස් ජීවිත ගෙන යාමට රුකුලක් වන ආයුර්වේදය උත්තරීතර වෛද්‍ය ක්‍රමයයි.
4. මිනිසා හා සොබාදහම යා කෙරෙන ආයුර්වේදය ජීවිත ගමනට රුකුලක් වෙයි.

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

5503

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
இறுதித் தவணைப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය - II

කාලය / நேரம் / Time: පැය 2 යි

නම / பெயர் / Name ..........................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. අංක I සිට X තෙක් සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) සිංහල අක්ෂර මාලාවේ අර්ධ ස්වර පිළිවෙළින් ලියන්න.
(ආ) ග, ජ, ඩ, ද, බ යන අක්ෂර හැඳින්වීම සඳහා දී ඇති පොදු නාමය කුමක් ද?

II. දී ඇති පදවලට විරුද්ධ පද ලියන්න.
(අ) ස්වාධීන (ආ) ප්‍රකෘති

III. දී ඇති පදවල අනුක්ත රූප ලියන්න.
(අ) සේකරයෝ (ආ) උපාසිකාවක්

IV. පහත දී ඇති ප්‍රකාශනවල ඉරි ඇඳි පද කුමන ක්‍රියා වර්ගයට අයත්දැයි නම් කරන්න.
(අ) කියනොත් කියපන් සී පද මා එක්ක
(ආ) කියන ඔහු මෙතෙපල

V. දී ඇති වචන යුගලය නොගැළපීමක් ඇත. ඒ අනුව පළමු වචනය හෝ දෙවන වචනය වෙනස්කර නැවත ලියන්න.
(අ) වියරණ දෝෂ (ආ) පැරණි චාරිත්‍ර

VI. පහත සඳහන් සන්ධිපදය විසන්ධි කොට කුමන සන්ධියට අයත්දැයි නම් කරන්න.
(අ) කාලෝචිත (ආ) ............................

VII. පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවන්න.
(අ) පියා දරුවන් සුරකියි. (ආ) ගුරුතුමිය ශිෂ්‍යයන් ඇමතුවාය.

VIII. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
"නානාභරණ ප්‍රතිමන්ඩිත සන්නාහ සන්නද්දවැ පිට හිඳිනා අසරුවන් විසින් ගැවසී ගත්..............."

IX. තරුණ + ය එක්වීමෙන් තාරුණ්‍ය යන පදය සෑදෙන්නා සේ පහත සඳහන් කොටස් එක්වීමෙන් සෑදෙන පද ලියා දක්වන්න.
(අ) විශාරද +ය (ආ) නිපුණ + ය

X. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.
(අ) පරපුරෙන් පරපුරට ලැබෙන හිමිකම (ආ) හිස නැති මළ කඳ

(ලකුණු 2 × 10 = 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩුවන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ) ඩෙංගු උණ රෝගය අද වන විට මාරාන්තික වසංගතයක් බවට පත් වී තිබේ. එයින් වටිනා ජීවිත රාශියක් රටට අහිමි වී ඇත. මේ වසංගතය මැඩලීම සඳහා කෙටිකාලීන මෙන්ම දිගුකාලීන වැඩ පිළිවෙලක් අවශ්‍ය වේ. ඊට රජය මහජනතාව සමග අත්වැල් බැඳගත යුතුය.



CamScanner

(34) පහත සඳහන් කවියේ හතරවන පදය දී ඇති වරණ අතුරින් තෝරන්න.

(ආ) සොබාසිරියෙන් පිරි අපේ රටේ සුන්දර ස්ථාන නැරඹීම සඳහා නන් දෙසින් දෙස් විදෙස් සංචාරකයෝ දහස් ගණනින් ඇදී එති. ඉන් විදේශිකයන්ට වඩා දේශීය පිරිස් හුදු විනෝදය තකා ම චාරිකා කරන අයුරු, බෝහෝ දෑ ඉවත ලමින් පරිසරයට විනා කරන අයුරු සුලබ දසුනකි. පරිසර හිතකාමී ව සුන්දරත්වය විඳ ගැනීම සඳහා ඔවුන් දැනුවත් කළ යුතු කරුණු ඇතුළත් කරමින් රචනයක් ලියන්න.

(ඇ) සාහිත්‍ය යහපත් සමාජයක් සඳහා දොරගුළු විවර කර දෙයි. සාරධර්ම පෝෂණයට ඉන් ලැබෙන පිටුවහල විශාලය. අපගේ අතීත සමාජය දෙස බැලූ විට එය මැනවින් පසක් වෙයි. වර්තමාන සමාජයටද සංවේදී මනසකින් කටයුතු කිරීමට අවශ්‍ය මග හෙළි කිරීමට සාහිත්‍ය ඉවහල් කර ගත හැකිය.

(ඈ) කම්පියුටරය, ලැප්ටොප්, ටැබ්, ස්මාර්ට් ෆෝන් වැනි මෙවලම් අත්පත් කර ගැනීම නූතන පරම්පරාවේ එක් සිහිනයකි. ඒවායින් කළ හැකි දෑ බෝහෝය. ලොව වටා තොරතුරු ගවේෂණය කරමින් ඒවා අධ්‍යයන කාර්යයට ඉවහල් කර ගැනීමට වඩා හුදු විනෝදාත්මක හා අසැබි ඉසව් වෙත යොමුවී ඊට ලොල්වීම නිසා ළමා මනස විකෘති වීමෙන් ගැටලු පැන නැගී ඇත. ඒවා සිහි නුවණින් භාවිත කිරීම සඳහා සමාජය දැනුවත් විය යුතුය.

(ලකුණු 25)

03. පහත දැක්වෙන පාඨය වචන 40 - 50 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

සංස්කෘතිය යන පදය මානව විද්‍යාඥයන් විසින් ව්‍යවහාර කරනු ලබන්නේ යම් කිසි පුද්ගලයකු ඔහුගේ රටේ සමාජයෙන් ඇබ්බැහි කරගන්නා ඇදහිලි, සිරිත් විරිත්, ශිල්පකලා, සම්ප්‍රදාය, කර්මාන්ත යන ආදිය එක්කොට හඳුන්වනු පිණිසය. ඒ සියල්ල ඔහු ලබන්නේ අතීතයේ සිට එන දායාදයක් වශයෙනි. එයින් ඇතැම් ඇදහිලි හා සිරිත් ආදිය ඔහු ඉගෙන ගන්නේ නිතැතිනි. ඇතැම් දේ ඔහුට ඇබ්බැහි කරනු ලබන්නේ අන්‍යයන් විසින් ඉගැන්වීමෙනි. සංස්කෘතිය යන නමින් හැඳින්වෙන සියලු දේ ඔහු ලබන්නේ ඔහුගේ සමාජයෙන් බව යට කියන ලද විවරණයෙන් පෙනේ. සමාජ යාන්ත්‍රණය පහළ වන්නේ ජන සමූහයක් නිසාය. සංස්කෘතිය සභ්‍ය මනුෂ්‍යයන්ට පමණක් නොව දඩයමින් ජීවත් වන වැද්දන්ට හිමි වූවකි. ම්ලේච්ඡයන්ගේත් ශිෂ්ට මනුෂ්‍යයන්ගේත් සංස්කෘතීන් වෙනස් වන්නේ සංකීර්ණ ලක්‍ෂණ විසිනි.

(ලකුණු 10)

04. පහත දැක්වෙන කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වාග්වේදියෙකු ක්‍රියා කරනුයේ සමාජ විද්‍යාඥයා මෙනි. ක්ෂේත්‍ර පර්යේෂණ, පුස්තකාල පරිහරණය මෙන්ම රසායනාගාරය ද ඔහුගේ කාර්යයන් සඳහා යොදාගත හැකිය. ඔහු පැරණි ලේඛන ද අධ්‍යයනය කරන නමුත් ජීවමාන භාෂා අධ්‍යයන කේන්ද්‍ර වෙයි. වාග් විද්‍යාඥයා යන්න ද භාෂා ගැන අවබෝධයක් පතන්නකු හෝ භාෂා බොහෝමයක් දන්නකු හෝ භාෂා අධ්‍යයන කුසලතා වර්ධනය කරගෙන ඇත්තකු හෝ විය හැකිය. භාෂා ඉගෙනීම භාෂා ගැන ඉගෙනීමට වඩා වෙනස් වෙයි. වෙනස වාහනයක් පැදවීමට ඉගෙනීම හා වාහනයක යාන්ත්‍රික ක්‍රියාවලිය ඉගෙනීම මෙන් පරස්පරය. වාග් විද්‍යාඥයකු වීමට භාෂා රාශියක් දැන සිටීම හෝ භාෂා භාවිතය පිළිබඳ අධිකාරයක් දරන්නකු වීම අවශ්‍ය නොවේ. වාග් විද්‍යාඥයා භාෂාව හා සම්බන්ධ සමාජ සංස්කෘතික ප්‍රපංචයන් අධ්‍යයනය කරන්නෙකි. පිළිගතහැකි වාක්‍ය ස්වරූප හෙවත් වාගුක්තීන්වලට පාදක වන ව්‍යූහය සොයා බලන ඔහු එයට අදාළ නීති සලකා බලයි.

(i) වාග්වේදියා හා සමාජ විද්‍යාඥයා ක්‍රියාකාරිත්වයෙන් සමාන වන්නේ කවර හේතු නිසා ද?
(ii) වාග්වේදියා ප්‍රමුඛස්ථානය දෙන්නේ කවර ක්ෂේත්‍රයක් කෙරෙහි ද?
(iii) භාෂා ඉගෙනීම හා භාෂා ගැන ඉගෙනීම පැහැදිලි කරන නිදසුන සඳහන් කරන්න.
(iv) වාග් විද්‍යාඥයාගේ අධ්‍යයනයට ලක් වන්නේ කුමක් ද?
(v) පහත සඳහන් යෙදුම්වල අදහස පැහැදිලි කරන්න.
(අ) අධිකාරයක් (ආ) අධ්‍යයනය

(ලකුණු 2 ×5 = 10)

05. කලුන්තැන්න විමලධර්ම මධ්‍ය මහා විද්‍යාලයේ වාර්ෂික කලා උළෙල උත්සවාකාරයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්,

පවුල් 200ක් පමණ ජීවත්වන නඳුන්ගම ගම්මානයට තවමත් විදුලි බලය ලබාදී නොමැත. මෙහි බොහෝ දෙනා ස්වයං රැකියාවල නිරත වෙමින් දිවි ගෙවති. විදුලි බලය ලැබීමෙන් ඔවුන්ටද ඔවුන්ගේ පාසල් යන දූ දරුවන්ටද සිය කාර්යයන් පහසුවෙන් කර ගැනීමට හැකිවනු ඇත. මේ කරුණු සැලකිල්ලට ගනිමින් ඔබ ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් සුනෙත් ජයලත් යැයි සිතා නඳුන්ගම අයත් විදුලිබල කාර්යාලය වන ජයතිස්සපුර විදුලිබල මණ්ඩලයේ අධිකාරි වෙත විදුලිය සැපයුම කඩිනමින් ලබාදෙන ලෙස කෙරෙන ඉල්ලීම සඳහා රාජකාරි ලිපියක් සකස් කරන්න. (වචන 100ක් පමණ සෑහේ)

(ලකුණු 15)



CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

15492

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - III | කාලය / நேரம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

- 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වන අතර 5, 6, 7 යන ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. අංක I සිට X තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) පන්සිය පනස් ජාතකපොත සඳහා මූලාශ්‍ර වූ ග්‍රන්ථය නම් කරන්න.
(ආ) ජාතකපොතෙහි කතාවස්තු ප්‍රමාණය කොතෙක් ද?

II. "දේවයන්වහන්ස කොටපිය යුතු කතාවෙක් ඇත"
(අ) ඉහත සඳහන් පාඨය ඇතුළත් පාඩම කුමක් ද?
(ආ) එම පාඩමට අදාළ වූ කතාව නම් කරන්න.

III. (අ) ජාතක කතා ඇසුරු කරගෙන රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍ය ලිවීමට ආරාධනා කළ තැනැත්තා නම් කරන්න.

IV. "තත මතුද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
.................................................."

(අ) මෙම කවියේ සතරවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) තතට අමතරව සිඳින ලද්දේ කුමක්ද?

V. (අ) "හානා හීය පානා අඬහැරෙන් දැනේ" වැනි ජන කවි අයත්වන කාව්‍ය වර්ගය කුමක් ද?
(ආ) කෘෂිකර්මය ආශ්‍රිත ජනකවි වර්ග දෙකක් නම් කරන්න.

VI. (අ) බැද්දේගම නව කතාවේ මුල් කතුවරයා නම් කරන්න.
(ආ) විදේශිකයන් අපේ රට අළලා ලියූ වෙනත් නව කතා දෙකක් නම් කරන්න.

VII. (අ) "මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය පන්තිය උපුටාගත් මුල් ග්‍රන්ථය නම් කරන්න.
(ආ) මහින්ද හිමියන් ලියූ මුල්ම කාව්‍ය කෘතිය නම් කරන්න.

VIII. (අ) කුඩලිගම කවියා සිය නිර්මාණ සඳහා ආභාසය ලැබූ භාරතීය කවියා නම් කරන්න.
(ආ) කුඩලිගම කවියා හැඳින්වූ අන්වර්ථ නාමය කුමක් ද?

IX. (අ) එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත වෙනත් නාට්‍ය දෙකක් නම් කරන්න.
(ආ) එතුමා විසින් රචිත ස්වයං චරිතාපදානය නම් කරන්න.

X. "මේ ගම දැන් හොල්මන් අධිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්ණි ගමකි"
(අ) මෙම කොටස ප්‍රකාශ කරන්නේ කවරෙක් ද?
(ආ) ගමට නරක කාලයක් පැමිණීම කියාපාන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 10 × 2 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

I. "මහරජ දෙසේනාව සටන් නොකොට මැනව, රජවරුන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක තැනට එද්ද, ඉන් එක්කෙනෙක් වැන්දවූ නම් වැඩි පක්ෂයේ රජහට පරාජය වන්නේය"
(අ) මෙහි දැක්වෙන අවස්ථාව සඳහා පාඩමේ දැක්වෙන නම කුමක් ද?
(ආ) රජවරුන් දෙදෙනාගේ හා පණ්ඩිතවරුන් දෙදෙනාගේ නම් පිළිවෙළින් සඳහන් කරන්න.



CamScanner

II. "නහින දෙහින කාලෙට පින් කෙරුම   පුන
වහින කලට කුරින් විල්වලින්   එන
බහින දියෙන් දෝනක් මුත් ගතොත්   ඇත
පනින පිලවුන්ට ඉනිමං කමක්   නැත"
(අ) මෙහි දැක්වෙන නිරර්ථක ක්‍රියාව කුමක් ද?
(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

III. "පිළියෙල කරගත් කුරක්කන් රොටී කිපයකුත්, ගමන ගැන ඇසූ ගම්මුන්ගෙන් ලැබුණු තවත් ධාන්‍ය ඇට ටිකකුත් ලේන්සුවක ඔතාගෙන ඈ කඹුරුපිටිය බලා පිටත් වූවාය"
(අ) ඇයගේ මෙම ගමනේ අරමුණ කුමක් ද?
(ආ) ඇය සතු මාර්ගෝපකරණ මොනවා ද?

IV. "මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු   වියේ
ඇකයෙහි හෙළා හඩවයි සැඩ සුළඟ   රැයේ
සුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු   දියේ
සමහර තැනක ලස්සන මල් කැකුළු   තියේ"
(අ) සුළඟින් ගඟට පතිත වන පලතුරු වර්ග දෙකක් නම් කරන්න.
(ආ) පද්‍යයේ අවසන් පේළි දෙකේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

V. "සතුරන්ගෙන් බොහෝ දෙනා කුරුබිලියෙන් ඇතුළු නුවරට වදනාහ. සතුරුවැ ආ විටෙක, මුත් දුටුවන් නොඇල්ලන්නාහ. එසේ හෙයින් සතුරන්ගේ සඤ්චාරය නොසිඳෙන්නේය"
(අ) අංකිත පදවල අරුත් ලියන්න.
(ආ) සතුරන් නොඇල්ලන්නේ ඇයි? (ලකුණු 4 × 5 = 20)

03. රාජ්‍ය පාලනයේදී යොදාගත්,
I. යුද්ධ උපක්‍රම   II. සන්නිවේදන උපක්‍රම
උම්මග්ග ජාතක කතා කරුවා විස්මය දනවන පරිදි ඉදිරිපත් කරයි. උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.
නැතහොත්,
බැද්දේගම එහි වෙසෙන ගැමියන්ද සමග කෙමෙන් පරිහානියට පත්වීමෙහි ලා
I. ගැමියන් වන මැද හුදෙකලා වීමත්
II. ගම්වැසියන්ගේ නූගත්කමත් හේතු වෙයි. උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

04. ගැමියන් තුළ වූ
I. නිරීක්ෂණ හැකියාවත්   II. සංයමයත්
උපදේශ කවි මගින් පිළිබිඹු වන ආකාරය හානා හිය පානා අඬහැරෙන් දැනේ කවිපෙළ ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.
නැතහොත්,
දරුවන් තුළ කුඩා කාලයේ සිටම
I. ජාතිකාභිමානයත්
II. ආගමික භක්තියත් දැනවීම සඳහා එස්. මහින්ද හිමිගේ අපූර්ව කාව්‍ය නිර්මාණ ඉදිරිපත් කරති. උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. සොබාදහම පිළිබඳ නිරීක්ෂණයෙන් රසිකයා තුළ අපූර්ව සංකල්ප රූප උත්පාදනයට කවියා දක්වන චාතුර්යය 'ගංගාවේ සංගීතය' කවි පෙළ ඇසුරෙන් උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 15)

06. දූදරු මාපිය සෙනෙහස අපූරු අයුරින් පවුල් සංස්ථාව තුළ පවතින අයුරු සිංහබාහු නාට්‍ය තුළ නිරූපණය කරයි. උදාහරණ තුනක් සහිතව මේ කියමන සනාථ කරන්න. (ලකුණු 10)

07. ගුත්තිල කතුවරයා විවිධ කාව්‍ය උපක්‍රම භාවිත කරමින් අර්ථ රසයත් ශබ්ද රසයත් මනාව සංකලනය කර ඇත. මේ කියමන නිදසුන් තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 10)



CamScanner


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න